# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන

## 2021/2022 10 වන මට්ටම සඳහා අයදුම්පත් කැඳවීම

අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ (2021/2022 අධ්‍යයන වර්ෂය) 10 වන මට්ටම සඳහා අයදුම්පත් කැඳවීම 2021.10.10 සිට 2021.11.09 දක්වා සිදු කරනු ලැබේ. අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සම්මාන 60කින් සමන්විත අධ්‍යයන වර්ෂ දෙකක වැඩසටහනකි. එය මට්ටම් දෙකකින් සමන්විත වේ. (9 වන මට්ටම - පාඨමාලා වැඩ සහ 10 වන මට්ටම - පාඨමාලා දෙකක් සහ පර්යේෂණ නිබන්ධනය). අවම වශයෙන් GPA අගය 3.00 ක් සහිතව අධ්‍යාපනපති උපාධිය (SLQF) 9- සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් වැඩසටහනේ 9 වන මට්ටමේ (SLQF) 9- පාඨමාලා කාර්යන්ගෙන් නිදහස් කරනු ලැබේ.

10 වන මට්ටම සඳහා ලියාපදිංචි කිරීමට අපේක්ෂිත සිසුන් ගණන : 100

### 10 වන මට්ටම සඳහා ඇතුළත්වීමේ සුදුසුකම්

1. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන අධ්‍යාපනපති උපාධිය (SLQF 9) අවම වශයෙන් GPA අගය 3.00 ක් සහිතව සමත්ව තිබීම.

හෝ,

2. විශ්වවිද්‍යාල සනාතන සභාවට පිළිගත හැකි ඉහත සුදුසුකමට සමාන හෝ ඉහළ සුදුසුකමක් සහිත වීම.

**වැඩසටහනේ කාලය** : අවුරුදු 01

**අධ්‍යයන කටයුතු** : සියලුම අධ්‍යයන කටයුතු සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් ම කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි පමණක් පවත්වනු ඇත.

## අයදුම්කිරීමේ පිළිවෙළ

වැඩසටහනෙහි ලියාපදිංචි වන දිනයට හෝ ඊට පෙර, අදාළ ඇතුළත්වීමේ නිර්ණායක සපුරා තිබිය යුතුය. ඇතුළත්වීමේ සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා විවෘත විශ්විද්‍යාලය මගින් පවත්වනු ලබන තෝරා ගැනීමේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

තෝරාගැනීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබුවහොත්, එය සමත්වන අයදුම්කරුවන් පමණක් උපාධි වැඩසටහනට ඇතුළත් කරගැනීමට පෙර පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(සැ.යු.) : උපාධි වැඩසටහන සඳහා අයදුම්පත් යොමු කිරීමට පෙර අයදුම්කරුවන් විසින්, තමන් අදාළ ඇතුළත්වීමේ සුදුසුකම් සපුරා ඇත්දැයි යන්න තහවුරු කරගත යුතු වේ. තෝරාගැනීමේ පරීක්ෂණය සමත්වීමෙන් පමණක් උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණවීම සිදු නොවේ.)

**අයදුම් කිරීම**
අන්තර්ජාලයෙන් පමණයි

**අන්තර්ජාලය ඔස්සේ අයදුම් කිරීමට අපගේ වෙබ් පිටුව වන** https://ums.omis.site **වෙත පිවිසෙන්න.**
**අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් භාරදීම : 2021.10.10 සිට 2021.11.09 දක්වා.**
**අයදුම්පත් ගාස්තුව : රු 1050/-**

- අයදුම්පත් ගාස්තුව ගෙවීම ඔබගේ ක්‍රෙඩිට් / ඩෙබිට් බැංකු කාඩ්පත් මගින් සිදු කළ හැකිය
- අන්තර්ජාලය ඔස්සේ පමණක් අයදුම්පත් භාරගනු ලැබේ.
- අන්තර්ජාලය ඔස්සේ අයදුම් කිරීම පිළිබඳව තොරතුරු සහ පහසුකම් ලබාගැනීම සඳහා පහත දැක්වෙන තොරතුරු ද රැගෙන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථානයක් වෙත පැමිණෙන්න.
  - අයදුම්කරුගේ සම්පූර්ණ නම
  - ලිපිනය
  - ජාතික හැඳුනුම්පත් අංකය
  - විද්‍යුත් තැපැල් ලිපිනය (email address)
  - ජංගම දුරකථන අංකය
- ඩෙබිට්/ ක්‍රෙඩිට් බැංකු කාඩ්පත් නොමැති අයදුම්කරුවන් තමන්ට ආසන්නතම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථානයක් වෙත පැමිණ මුදල් මගින් ගාස්තු ගෙවීම සිදු කළ හැකිය.
- මහජන සම්බන්ධතා කාර්යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ : පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා (රජයේ නිවාඩු දින හැර)
- අනෙකුත් මධ්‍යස්ථාන : පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා (ඉරිදා, සඳුදා, සහ රජයේ නිවාඩු දින හැර)
- අන්තර්ජාලය ඔස්සේ අයදුම්කිරීම පිළිබඳ තොරතුරු සහ පහසුකම් ලබාගැනීම සඳහා පැමිණිය හැකි ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන :

කොළඹ (නාවල), මහනුවර (පොල්ගොල්ල), මාතර(නූපේ), අනුරාධපුරය, මඩකලපුව, යාපනය, බදුල්ල, කුරුණෑගල, අම්බලන්ගොඩ, අම්පාර, බණ්ඩාරවෙල, ගාල්ල, අම්බලන්තොට, කළුතර, කෑගල්ල, පොළොන්නරුව, මොණරාගල, රත්නපුර, වවුනියාව, හැටන්, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, මුලතිව්, ගම්පහ, පුත්තලම, කුලියාපිටිය, මාතලේ සහ මන්නාරම

### තෝරා ගැනීමේ පරීක්ෂණය

- මාර්ගගත තේරීම් පරීක්ෂණය 2021.11.28 දින පවත්වනු ලැබේ. (අවශ්‍ය වුවහොත් පමණි)

මාර්ගගත තේරීමේ පරීක්ෂණය පිළිබඳ වැඩිදුර විස්තර ඔබ අයදුම්පතෙහි සඳහන් කළ විද්‍යුත් තැපැල් ලිපිනයට **(email)** එවනු ලැබේ. එබැවින් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය **(email address)** අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කරන්න.

**වැඩිදුර විස්තර සඳහා අමතන්න :**

- පාඨමාලාවේ ශිෂ්‍ය මාර්ගෝපදේශක පොත ලබාගැනීම සඳහා https://ou.ac.lk/proinfo-sectertiary/ වෙබ් පිටුව වෙත පිවිසෙන්න.
- මහජන සම්බන්ධතා කාර්යාලය : 0112 88 1000 / 256
- අංශාධිපති/ ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යයනාංශය : 0112 88 1425 / hdste@ou.ac.lk
- සම්බන්ධීකාරක/ අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන : 071 841 4494 / dvsil@ou.ac.lk

ලේඛකාධිකාරී - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ.